(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 157.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 ජුනි 23 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1184/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ, තමිල්වෝලෙ විද්‍යාලය නමින් පාසලක් පැවැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පාසල ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම පාසලේ සිසුන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට සහ 05 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට අවසන් වරට පෙනී සිට ඇති වර්ෂ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මේ වනවිට ඉහත පාසලේ නාමය කවරේද;

(v) එම පාසලේ නාමය සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබුයේ කවුරුන් විසින්ද;

(vi) ඊට හේතු කවරේද;

(vii) එම සංශෝධනය කරනු ලැබූ දිනය කවරේද;

(viii) එම පාසලේ නාමය සඳහා එම පාසලේ නිර්මාතෘවරයාගේ හෝ පාසල ආරම්භ කිරීමට පුරෝගාමීවූ පුද්ගලයෙකුගේ නමක් යොදා ගත හැකිද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1363/2025

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) යම් පාසලක අවුරුදු අටකට වැඩි කාලයක් සේවය කරමින් සිටින විදුහල්පතිවරුන්ගේ සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) විදුහල්පතිවරයෙක් එකම පාසලක අවුරුදු අටකට වැඩි කාලයක් අඛණ්ඩව සේවයේ යෙදීම හේතුවෙන් උද්ගතවී ඇති ගැටලු කවරේද;

(iii) 2012 වර්ෂයේදී අධි සේවක පදනම මත, විදුහල්පතිවරුන් ලෙස අන්තර්ග්‍රහණය කරනු ලැබ ඇති තැනැත්තන් හට උසස්වීම් ලබාදී ඇතත්, ඔවුන්ගේ සේවයට අදාළ පරිපාලන දීමනා ලබාදී නොමැති බව දන්නේද;

(iv) ඒ සඳහා ඇති බාධා කවරේද;

(v) පාසල්වල පවතින විදුහල්පති පුරප්පාඩු සඳහා, අධි සේවක පදනමේ සිටින විදුහල්පතිවරුන්ට අයදුම් කිරීමට පවතින බාධා කවරේද;

(vi) අවුරුදු අටකට වැඩි කාලයක් එකම පාසලක අධි සේවක පදනම මත සේවය කරන විදුහල්පතිවරුන්ට, ස්ථාන මාරු ලබා දීමේ හැකියාව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1408/2025

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වන්නි මැතිවරණ දිස්ත්‍රික්කයට අයත් වවුනියාව, මන්නාරම හා මුලතිව් යන පරිපාලන දිස්ත්‍රික්කයන්හි තමන්ටම හිමි ඉඩම්වල ජීවත් වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් අතරින්, රජයෙන් නීත්‍යානුකූල ඉඩම් බලපත්‍ර ලබා ඇති සහ ඉඩම් බලපත්‍ර ලබා නොමැති පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම දිස්ත්‍රික්කයන්හි පදිංචි ජනතාවගේ ඉඩම් සම්බන්ධ ගැටලු විසඳීම සඳහා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් සම්පාදනය කර තිබේද;

(iv) එසේ නම්, එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට නියමිත දිනය කවරේද;

(v) පසුගිය රජය සමයේදී ක්‍රියාත්මක කරන ලද 'උරුමය' වැඩසටහන යළි ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1470/2025

ගරු වානක මාදුගොඩ මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෙළඳපොළ තුළ ක්‍රීඩා භාණ්ඩවල මිල ඉතා සීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් ග්‍රාමීය ක්‍රීඩකයන් දැඩි දුෂ්කරතාවයන්ට පත්වී ඇති බවත්;

(ii) ක්‍රීඩා භාණ්ඩවල මිල, ග්‍රාමීය ප්‍රදේශවල ක්‍රීඩාව සංවර්ධනය කිරීමේදී බලපාන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ක්‍රීඩකයන්ට ක්‍රීඩා භාණ්ඩ සහන මිලට ලබා දීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ක්‍රීඩා භාණ්ඩ ආනයනය කිරීම වෙනුවට ඒවා ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1473/2025

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ තලෙයිමන්නාරම ප්‍රධාන මාර්ගයේ බටහිර තාරාපුරම් ග්‍රාම සේවා කොට්ඨාසයේ, නිම නොකර අතහැර දමන ලද සමුපකාර ගම්මාන ව්‍යාපෘති ගොඩනැගිලි දෙකක් ඇති බව දන්නේද;

(ii) එම ඉදිකිරීම් සඳහා, මන්නාරම ප්‍රාදේශීය සභාවේ අනුමතිය ලබා ගෙන තිබේද;

(iii) ඒවා ඉදිකළ අරමුණ කවරේද;

(iv) ඉහත ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තාව ඇතුළු සියලු බලපත්‍ර ලබා ගෙන තිබේද;

(v) එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කිසියම් විමර්ශනයක් පවත්වා තිබේද;

(vi) එසේ නම්, එහි වාර්තාව ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ප්‍රකාශන ඔප්පුවක් මඟින්, ශ්‍රී ලංකා සීමාසහිත ව්‍යවසායක සංවර්ධන සමුපකාර සංගමය විසින් නීති විරෝධීව හිමිකාරීත්වය ලබාගත් ඉඩමක මෙම ගොඩනැගිලි ඉදිකර ඇති බව දන්නේද;

(ii) ඉහත ව්‍යාපෘතිය සඳහාම පිහිටුවා, එම අමාත්‍යාංශයේම ලියාපදිංචි කර ඇති, අක්‍රිය තත්ත්වයේ පවතින මෙම සංගමයේ ලියාපදිංචි ලිපිනය, ලියාපදිංචි කළ දිනය සහ ලියාපදිංචි අංකය කවරේද;

(iii) එහි ව්‍යවස්ථාවේ පිටපතක් ඉදිරිපත් කරන්නේද;

(iv) එහි සභාපතිතුමිය සහ අනෙකුත් සාමාජිකයින්ගේ නම්, පෞද්ගලික ලිපිනයන් ඇතුළු ඔවුන්ගේ විස්තර කවරේද;

(v) එමඟින් මෙතෙක් ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති පිළිබඳ විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1475/2025

ගරු රොෂාන් අක්මීමන මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ගැසට් කර හෝ හඳුනාගෙන ඇති රක්ෂිත වනාන්තර ප්‍රමාණය සහ රක්ෂිත වනාන්තර බවට පත් කිරීමට යෝජිත වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර්වලින් කොපමණද;

(ii) දීර්ඝ කාලයක් තිස්සේ පදිංචිවී ඇති හෝ වගා කටයුතු සඳහා භාවිතා කර ඇති නමුත්, පසුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතට ගෙන ඇති ඉඩම් ප්‍රමාණය එම දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම්වලින් නැවත නිදහස් කිරීම සඳහා නිර්දේශ කර ඇති ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම පාලනය කිරීම සඳහා සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1855/2026

ගරු සුනිල් රත්නසිරි මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව පිහිටුවන ලද වර්ෂය කවරේද;

(ii) ආරම්භයේදී සහ මේ වනවිට දෙපාර්තමේන්තුව සතු දුම්රිය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ආරම්භයේදී සහ මේ වනවිට දුම්රිය මාර්ග පද්ධතියේ මුළු දුර වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) දුම්රිය සංඛ්‍යාව සහ දුම්රිය මාර්ග පද්ධතියේ මුළු දුර වර්තමානය දක්වා විකාශනයවී ඇති ප්‍රමාණය සැලකීමේදී, එම වැඩිවීම ප්‍රමාණවත් වන්නේද;

(v) නොඑසේ නම්, දුම්රිය සංඛ්‍යාව සහ දුම්රිය මාර්ග පද්ධතියෙහි දුර වැඩි කිරීම සඳහා අවධානය යොමු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාර්ග අනතුරු අවම කර ගැනීම සඳහා 2026 අයවැය මඟින් වෙන් කර ඇති ඇස්තමේන්තුගත ප්‍රතිපාදන කොපමණද;

(ii) පාසල් දරුවන් ප්‍රවාහනයේදී සිදුවන අනතුරු අවම කිරීම සහ දරුවන්ට සිදුවිය හැකි අපචාර වැළැක්වීමට පවතින නියාමනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නාගරික ප්‍රදේශවල ඇති අව්ධිමත් ඉදිකිරීම් විධිමත් කිරීමේ වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1907/2026

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අභාවප්‍රාප්ත එම්.එච්. මොහොමඩ් මහතා අමාත්‍ය ධුරය දරන කාලයේ සිට ජාතික මීලාදුන්-නබි උත්සවය දිස්ත්‍රික්ක මට්ටමෙන් සැමරීම ආරම්භවූ බවත්;

(ii) අභාවප්‍රාප්ත ඒ.එච්.එම්. අස්වර් මහතා අමාත්‍ය ධුරය දරන කාලයේ ජාතික මීලාදුන්-නබි උත්සවය ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවැත්වූ බවත්;

(iii) ඉන් අනතුරුවද දිස්ත්‍රික්ක මට්ටමින් එම උත්සවය පැවැත්වූ බවත්;

(iv) එමඟින් නොදියුණු මුස්ලිම් දේවස්ථාන ප්‍රතිසංස්කරණය කරන ලද අතර මුස්ලිම් ගම්මානද සංවර්ධනය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2026 වර්ෂයේ ජාතික මීලාදුන්-නබි උත්සවය පැවැත්වීමට දැනට තීරණය කර ඇති දිස්ත්‍රික්කය සහ ප්‍රදේශය කවරේද;

(ii) එම උත්සවය අරලියගහ මන්දිරයේදී පැවැත්වීමට බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට දැනුම්දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1939/2026

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් මුළු දුම්රිය රක්ෂිත භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එම භූමිය පරිහරණය කරන ආකාරය සහ ඒ සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) දුම්රිය මාර්ගය දෙපස වෙන් කර ඇති රක්ෂිත භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එම රක්ෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීම, පිරිසිදු කිරීම සහ නඩත්තු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) රක්ෂිත ප්‍රදේශ හරහා ඇති පළාත් පාලන ආයතන විසින් නඩත්තු කරනු ලබන මාර්ග සංවර්ධනය කිරීමේදී ඇතිවන ගැටලුකාරී තත්ත්වයන් පිළිබඳව දන්නේද;

(vi) එම මාර්ග පිළිසකර කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී
### **යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— වරප්‍රසාද (අංක 1),— ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. එම්. මරික්කාර් මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 නොවැම්බර් 13 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

2.

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— වරප්‍රසාද (අංක 2),— ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2026 ජුනි 10 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මාර්තු 31 දිනැති අංක 2482/09 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මැයි 04 දිනැති අංක 2487/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 මැයි 07 දිනැති අංක 2487/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.09 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

5.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ (අවලංගු කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*6.

ජාතික පාරිසරික (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියමය,— 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 1(2) වගන්තිය යටතේ එවකට බලශක්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මාර්තු 05 දිනැති අංක 2478/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පුරාවස්තු ආඥාපනත යටතේ නියෝග,— (188 අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 46 වගන්තිය සමඟ කියවිය යුතු 47 වගන්තිය යටතේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් 2026 අප්‍රේල් 11 දින සාදන ලදුව, 2026 ජුනි 12 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*15.

විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— "2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

18.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

19.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

20.

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

21.

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

2001/2026

ගරු රවී කරුණානායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2000 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කරන ලද ජාතික 'වැඩියෙන් භෝග වවමු' හෝ ඒ හා සමාන කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව සහ ඒවා ක්‍රියාත්මක කරන ලද අමාත්‍යාංශ හෝ ආයතනික රාමු කවරේද;

(ii) එම වැඩසටහන් යටතේ පොහොර සහනාධාර, වාරිමාර්ග පහසුකම් පුළුල් කිරීම, බීජ සංවර්ධනය, ව්‍යාප්ති සේවා, අලෙවිකරණය සහ ගබඩා යටිතල පහසුකම් සඳහාද ඇතුළුව වාර්ෂිකව වැය කරන ලද මුළු රාජ්‍ය වියදම කොපමණද;

(iii) එම වැඩසටහන් සම්බන්ධයෙන් ස්වාධීන කාර්ය සාධන විගණන හෝ බලපෑම් තක්සේරු කිරීම් සිදු කර තිබේද;

(iv) එසේ නම්, ඒවායෙහි වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබේද;

(v) ඉහත කී කාලපරිච්ඡේදය තුළ ගොවියාගේ ලාභදායිත්වය, වගා කරන ලද අක්කර ප්‍රමාණය, හෙක්ටයාරයකට බෝග අස්වැන්න, නිෂ්පාදන පිරිවැය සහ ඇස්තමේන්තු කළ පසු අස්වනු හානි සම්බන්ධයෙන් නිරීක්ෂණයවූ ප්‍රවණතා කවරේද;

(vi) ආනයන ආදේශනය තිරසර කිරීම සහ දේශීය කෘෂිකර්මාන්තයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම අවහිර කිරීමට තුඩුදී ඇති පොහොර ප්‍රතිපත්ති වෙනස්වීම්, වාරිමාර්ග පද්ධතිවල ඌනතා, ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම, සැපයුම් දාම අකාර්යක්ෂමතා, වෙළඳපොළ විකෘති කිරීම්, මිලකරණ අවිනිශ්චිතතා හෝ දැරිය හැකි ණය පහසුකම් සඳහා ප්‍රවේශය සීමිත වීම ඇතුළු ව්‍යුහාත්මක සීමාවීම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?